# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

# Ministry of Finance, Planning and Economic Development

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 120(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 392

பொது தொழில்முயற்சிகள் குழுவினால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இல. 120(4) இன் கீழ் கௌரவ அமைச்சரால் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகளை முன்வைத்தல்.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இல. 392

Presenting the observations and action taken by the Honorable Minister under Standing Order No. 120(4) regarding the reports tabled by the Committee on Public Enterprises in Parliament

Parliamentary Series No. 392

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 392

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இல. 392

Parliamentary Series No. 392

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Finance, Planning and Economic Development

# පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 392

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුව

( පළමු වැනි සභාවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ  හයවැනි වාර්තාව

(ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් **2023** වර්ෂයට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව හා එහි වර්තමාන කාර්ය සාධනය සම්බන්ධයෙන් **2025.06.04** දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවට අදාළ මහා භාණ්ඩාගාරයේ නිරීක්ෂණ)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හයවැනි වාර්තාව

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් **2023** වර්ෂයට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව හා එහි වර්තමාන කාර්ය සාධනය සම්බන්ධයෙන් **2025.06.04** දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවට අදාළ මහා භාණ්ඩාගාරයේ නිරීක්ෂණ

| සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ |
|---|---|---|
| **1.1 සිට 1.6 දක්වා සාකච්ඡා කළ කරුණු** | පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 392හි සඳහන් වන පරිදි | • අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 1.1 සිට 1.6 දක්වා සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග ඉදිරිපත් කරනු ඇත. |
| **1.7 අභ්‍යන්තර විගණනය**<br>අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව, ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරු 1, සහකාර අභ්‍යන්තර විගණක තනතුරු 1, වැඩ සහායක තනතුරු 2 වශයෙන් තනතුරු 4ක් අනුමත වී ඇති නමුත් ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම මෙතෙක් අනුමත කර නොතිබීම. | i. අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම | • විශ්වවිද්‍යාලය සඳහා අනුමතව පවතින ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර සඳහා පත් කරනු ලබන නිලධාරීන් රඳවා ගැනීමට අපහසු බැවින් සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2020.12.04 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද බව සඳහන් වුවත් පවත්නා ලිපිගොනු තුළින් තොරතුරු සපයා ගත නොහැක.<br><br>• කෙසේ වුවත් 2025.12.08 දිනැතිව ඉදිරිපත් කර ඇති නව තනතුරු 222ක් ඇති කිරීම සඳහා වන ඉල්ලීමෙහි සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීමට අනුමැතිය ඉල්ලා ඇත.<br><br>• එම තනතුරු අනුමත කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන වැඩිදුර කරුණු විමසීමට කටයුතු කර ඇති අතර එම තොරතුරු ලද පසු සේවා අවශ්‍යතාවය අනුව එකී තනතුරු ඇති කිරීම පිළිබඳ තීරණයක් ලබා දීමට හැකි වනු ඇත. |

| සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ |
|---|---|---|
| **1.8 සිට 4.2 දක්වා සාකච්ජා කළ කරුණු** | පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 392හි සඳහන් වන පරිදි | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 1.8 සිට 4.2 දක්වා සාකච්ජා කළ කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග ඉදිරිපත් කරනු ඇත. |

**අනුර කුමාර දිසානායක**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය**